# වසත් සුළඟ

kavi.dinamina@lakehouse.lk

**ලිපිනය - අංක 35,
ඩී.ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.**



## අලුත් ගෙදර



තට්ටු දෙකයි
බැල්කනි තුනයි
නිදන කාමරම හතරයි
ලස්සනයි...

තාත්තගෙ කාමරේ
උඩ තට්ටුවෙ
අම්මගෙ යට තට්ටුවෙ
අපි තට්ටු දෙකේම
නිදාගන්නවා

එක කාමරයක් තිබුණ
එකම ඇඳක් තිබුණ
අපේ පරණ ගෙදර
දැන් ඒක පොළව යට
අලුත් ගෙයි බිත්ති යට
ඒත් මමයි නංගියි
ඒක හොයනව
හැමදාම රෑට...

**දිමුතු ප්‍රසාද් උඩුගමසූරිය**

## කිලිටි

නංගිත් මමත්
ඇඹිල්ල කැඩීමට
ඇතුළු වූයෙමු වන වදුලට

ඒ කොල්ලා
ඒ කෙල්ලගෙ
මල් ගවුම කරෙන් පහත්කර
ළැම සිප ගත්තේය

"අයියෙ අර "..!

මොකටද ඒවා අපිට
අපි ආවෙ ඇඹිල්ල කඩන්න

"අයියෙ ඒ කොල්ලා හිටියෙ
සිවුරක් පොරවාගෙන "

නංගියෙ පිස්සුද උඹට
පුවක් පැලේක ඉදුණු අත්තක්
තිබුණේ බිමට පාත්වෙලා
ඒ දෙන්නගෙ පිටිපස්සෙන්

**කීර්ති එස්. කුමාර**

## අපි අපේ කිච්චාට

පෙති සැලී පාවඩය එළු තුරු වියන් යට
දෑල අත් බැඳී අපි ගිය ගමන් අමතක ද
දම් පාට හැන්දෑව රන් වනින් හැඩ කෙරුව
නුඹම සෙනෙහෙන් වැලඳ ගත් සිනා අමතක ද....

වසන්තය ජීවිතය පුරාවට යැයි කියා
සවනතට කොඳුරලා කියූ බස් අමතකද
මේ තරම් ඉක්මනට සමු අරන් දුර යන්න
නුඹම මා, මා නුඹයි කියූ වග අමතකද....

සංසාර චාරිකා දුරයි ඒ දුර වැඩියි
තවත් ඉවසා ඉන්න බැරි කරුණු දන්නවද
අපි අපේ කිච්චාට අපි අපේ නොවේනම්
වෙන්ව යනු මිසෙක ඉවසා ඉඳුම් කුමකටද

**අනෝමජී රාජපක්ෂ**



## පුනරුදයක අරුණලු

පුනරුදයක නව අරුණලු
නැගෙන යාමයේ
පෙරමඟ සුබ ලකුණු
රැගෙන රැය ගෙවී ගියේ

උතුර දකුණ එක කොඩියක
සෙවණකට වැටී
මිතුර බලනු ඔබ අප දුටු
සිහිනයට වඩී

ශිකර දුදුළු තරණය කොට
ඔබ පැමිණි මගේ
වැතිර සිඹිමි පිය සටහන්
මල් සුවඳ දිගේ

**නයෝමී අමරසිංහ**

## වංක ආලය

පතිනි මවුගෙන් වරම් ලබලා ගුණ දහම් පිරි ඔහුගෙ — බාරිය
නරක නපුරුම එකියෙකැයි කතුන් ඉදිරියෙ දෙසුම — කාරිය
සසර හමුවක් ලෙස සිතා පරම ආලය අන්ධ — බීරිය
හැඟුම් සමඟින්ම සෙල්ලම් මොවුන් හට පායයිද — සූරිය

රාග ගින්නෙන් ඇවිළිලා නිති එළදෙනා තුරු පවත් — මීරිය
ඈගෙ නිරුවත දකියි රුදු නෙත නොගැලුවත් කිසි විටෙක — සාරිය
නේක පීඩා සීරුවට විත් ඇනෙන්නේ හදවතේ — කීරිය
ප්‍රේම කළ සිත් මරා දැමුමට ඇයිද මේ සා කලේ — වීරිය

**පවිත්‍රා සෙව්වන්දි උඩුවර ආරච්චි**

## පුතුනේ...

මිණක් උනත් ඇත්නං
මහ පොළව යට,
පලක් නොවේ එය
මිහි පිට කිසිවෙකුට ..
ගලක් නොවී කණෙකුට හෝ
සළෙලෙකුට ,
නිලක් වෙයන් හෙට
සක්විති කිරුළකට..!

කුලක් නොවී
ඉහ මොළ මත
පතිත වන
මෙරක් වෙයන්
සැඩ හිරු රැස්
වළක් වන...
තැනක් තනා
දිය උල්පත් උපද්දන
ලොවක් සදාපන්
සුර ලෝ පරද්දන..!



**මංජුලා**

## පිටුව හිස් බව දනිමි

තවම ඇවිදින් බලමි
පොත් ගුලෙහි දොර අරිමි
විටෙන් විට එහි එබෙමි
නුදුටු කිසිවක් සොයමි

පුරුදු පොත දැක ගනිමි
මතක දූවිලි පිසිමි
පෙරළමින් යළි වසමි
පිටුව හිස් බව දනිමි

**මල්කා රත්නතුංග**

## දකුණු අත

සාලිස් පස් වසක්
නොතනියට
උන්නත්....
රන්මුදුවක් නැතත්....
තනි නොකළ
දකුණු අත.....

**කුමාරි දසනායක**



## වැස්ස

මං හරි බයයි උඹට...
හීන් හඬකින්
වැහි බිංදු පොළොවට
කඩා වැටෙනකොට
මගේ හිත තිගැස්සුණා...
ඈත අහසේ
ගිනි පුපුරු විසිරෙනකොට
මට මාව අමතක වුණා...
පරණ චිත්‍රපටයක්
නෙත්මානේ
දැවටෙනකොට...
සීතලට මම
ඒ පපුවේ ගුලිවුණා...
සීත සුළං
අපිව වෙළාගත් විට
ලය පතුලේ මම තනිවුණා...
වැස්ස මම අදටත්
උඹට බයයි...
උඹේ ඔය
මූසල හඬ තුළින්
ඔහුගේ ආදර මිමිනුම්
මට ඇහෙනවා...
ඉතිං, උඹේ ඔය
මූසල හඬට මම අදත්
බයේ හැංගුණා...

**කුමාරි ප්‍රේමරත්න**

## (සහ)කම්පිත !

ඔබ සමඟ දුටු සිහින
ඔහු සමඟ සැබෑ වෙයි
වැඩ ඇරී ගෙදර එන
ඔහුට තේ හැදී එයි
වොෂින් මැෂිමෙන් අරන්
කොලර් යළි ඇතිල්ලෙයි
සබන් පෙණ, අයිස් කැට
නොකී ඔබ සුවෙන් දැයි?

සෝප් ඔපෙරා අතර
"රෑට කමු නේ ?" ඇසෙයි
එක වගේ මග් දෙකක
"ටී" පිරී සිනාසෙයි
දහයෙ හෙඩ්ලයින්වල
යතුරු පැදියක් හැපෙයි
ගමේ නම සමානයි !
"ඔයා බයවෙලා ඇයි?"

ක්ලිනික් දවසට එයත්
හාෆ් ඩේ නිවාඩුයි
මදක් ඉදිමුණු කකුල්
තවයි රෑ සනීපයි
දණිස් කැක්කුමට තෙල්
ප්‍රෙෂර්, ඩයබෙටිස්වයි
අරන් තවමත් ගෙදර
දුවන පුතු ඔයා දැයි?

**සුබිත ශ්‍රීමාල් බුලත්සිංහල**

## හිනාව

අපි....
රාමු කරනවා මනාව
සොයගන්නට
සැඟවුණු දිශාව

මුවා කළ දිනයකදි පර්දාව
මතකයක් විය හැක හිනාව

**ෂර්මිලා බංදුනී දංවත්ත**

## ඇතුළුවෙන්න තහනමක් ද

සඳ මඬලට සොරෙන් නුඹේ
වත මඬලට තරු එබෙන්න
නීල නයන ආකාසේ
වරුවක් තරුවක් සිඹින්න

දෑඟිල්ලෙන් සිත පටලා
කිරි සයුරේ ඉගිල්ලෙන්න
ඇතිල්ලෙමින් නුඹ කක්ෂෙට
ඇතුළුවෙන්න තහනමක් ද

නුඹෙ තරමට ඉඩක් කොයිබ
සින්දුර තිලකේ
ගිනි දේදුනු දෙබැම උඩින්
හිනැහෙනු පෙර සේ..

**චාමින්ද්‍යානි ජයවර්ධන**



## කාසල් වීදියේ දීය

නොඉඳුල් මුවට ඉරු රැස් රිදවාවි — කියා
සුහඹුල් තුවායෙන් වටකර සැපට — තියා
කම්මුල් රෝස, බල බල සතුටකින් — දයා
රෝහල් තාප්පෙන් පිට ලෝකයට — ගියා

මතු ලොව සම්පතකි සිර කර ඇති — දෑතේ
උතුරයි සතුට සෙනෙහස මවකගෙ — ගීතේ
ගිනිගත් සුළඟ වටකර ඇත ළඟ — පාතේ
රුදු හඬ නැගෙන මහ මඟමයි — අවිනීතේ

ගොරහැඩි හඬින් කැලඹෙන විට ළපටි — සිත
මොර දී හඬන බිලිඳෙකුගේ තෙමෙන — නෙත
වෙර දී වෙහෙසුනත් මවකගෙ සෙනේ — මත
කරනට දෙයක් නෑ ලොව ඔහොමමයි — පුත

නගරයෙ මහ මගේ යන එන තීරු — බෙදා
ඒ මත තිබුණි රතු මල් පිළිවෙළට — සදා
ලස්සන ඇතත් සුවඳක් නැත ලොවට — විදා
සමනලු බඹරු කිසි දිනයක නැතිය — රඳා

පරිසරයෙන් ම දැනගත යුතු — ජීවිතය
ඇඹරෙයි දිග ඇරෙයි කැරකෙයි — මාරුතය
නළ මුදු සුළං හා ගඟුලැල් — සීමිතය
ඉවසුම නිසාවෙන් දිවිමඟ — පෝෂිතය

උඩුකුරු කෙනෙකි හරහට, තව අයගෙ — උරේ
යන පෙරහරකි පසු පස අය ගමන් — කෙරේ
කාසල් වීදියෙම කෙළවර නතර — කෙරේ
එක මඟ ගිය අයයි ඔක්කොම සියලු — වරේ

**සාලිය වික්‍රමසිංහ**



## සිරමැදිරියේ හිඳ ලියමි

සතුරන්ට මා හසු වුණේ මහ
වනේ දී නොසිතපු ලෙසින්...
පෙර භවයේ කළ පවක් හින්දා
හිරවුණේ මා මේ ලෙසින්...
මතක් වීලා බොහෝ හැඬුවා
මගේ සිත කාටත් හොරෙන්...
වියැකිලා හසරැලි අඳුරු වූවා
මගේ නෙතු නුඹ නැති සොවින්...

නොදැන අවුරුදු
බොහෝ ගෙවෙනවා
අතුරුදන් වී මා
ලොවෙන්....
අඳුරු කුටිය තුළ හිතින් හැඬුවා
මතක් වී මගෙ නෑ සියන්..
නුඹේ නෙතු මත නැගෙන
කඳුලැලි මැවී
පෙනුනා මට ඉතින්...
හිතේ සුසුම් බොල් සුළඟෙ එව්වා
නුඹට පණිවිඩයක් ලෙසින්...

ගතේ සවියත් ඉතිරි වී නැහැ
තවත් ඉන්නට මේ ලෙසින්....
ඉපදුණොත් මරණය නියත වේ
හිත හදාගන් ඒ ලෙසින්...
තුටින් යමි මම නුඹව හැරදා
සෑම දාටම මේ ලොවෙන්..
උපන් බිමේ ණය ගෙවා මා
මිය ගියේ රණවිරුවෙක් ලෙසින්..

**යසෝධා කත්‍රිආරච්චි**

## සිල් ගත් ලියදිවල කවි බණ ඇසේවා

පැසී කුඹුර නිල් සළු පොට එළාවී
වැසී යාය කරලින් කිරි වදීවී
බසී ගිරව් රන් යායට සිනාවී
වසී යල මහට නියඟය නිමාවී

පැටව් නිදන පැදුරට ඉසුරෙන් බෝවී
බිසව් හඬන ගොවි ගෙට සිරිකත ඒවී
පිලව් රජුන් මී පැණි වද බැඳ දේවී
හිලව් ණය තුරුස් කන්නෙට ගොඩ දාවී

මනිනාවී පෑල සොච්චම් කාසියට
වඩිනා සිටුවරුන් ලොරි ගෙන වාසියට
බුදුනා භෝග කිරි බත් පිදු දේශයට
දැනෙනා මිලක් ඇවැසිය බන්දේසියට

ධනිය ගොපල් මැදුරේ හිනැහෙයි කපට
දිනිය හැකිය මඩ සෝදා ගොවි අපිට
තනිය මකා වී අටු පිරෙනා කලට
මැනිය හැකි නොවෙද රන් අස්වනු බරට

බොල් වී කාටූ උඩු සුළඟට ඇදේවා
ඇල් කෙත් වසා රන් දියවර වසීවා
බැල් මෙන් මුවඟ මල් හසරැල් පිපේවා
සිල් ගත් ලියදිවල කවි බණ ඇසේවා

**මහගම සීලානන්ද හිමි**







## ප්‍රේම සංසර්ගය

බණ්ඩාර මං
උඹව මරාගෙන කෑවත්
ආයෙ ආයෙත්
මටම ආදරෙයි කියනව ද ?

සමහරක් ළද බොළඳ
දාමරික ප්‍රශ්නවල
ඒකිගේ ආදරේ
මහ හුඟක් තියෙනවා

ගෑනියෙක් ඉන්නවා
දරුපැටව් ඉන්නවා
ඒ වුණත් හෙටත් මං
උඹ හොයන් දුවනවා

පාට හේදුණු දෙතොල්
මුහුද රැලි කළ කොපුල්
බලාගෙන මොහොතකට
නිවෙනවා
ආය බැමි
හොයාගෙන දුවනවා

හති වැටුණු වෙලාවට
උඹේ පපුව බදාගෙන
අතීතෙක කාමයේ ගිලෙනවා
එදා වාගේම අදත්
මං උඹව සිහිකරන්
ප්‍රේම සංසර්ගයේ යෙදෙනවා

**කාව්‍යා සංකල්පනී**

## නුඹ නැතිව

සිහිනෙන් පවා විත් මට සෙනෙහස — පෑව
හිත යට තියාගෙන පෙම්බර කවි — ලීව
නුඹ අද නැති වුණත් පෙර මෙන් මා — ගාව
උපදියි සොමිනසක් මල් සුවඳට — දාව

**මධුභාෂිණී ජයසුන්දර**